
# මහදෙව් අඩවියේ විශ්මය

# "සඳරාජ වන අරණ"

**ලොවිතුරා බුදුරජාණන් වහන්සේ වේළුවනාරාමයේ වැඩ වසන එක් සමයෙක්හිදී එහි විසූ මහා සංඝයා වහන්සේ අතර ඇතිවූ භේදයක් සංසිඳවීමේ හොඳම උපාය මාර්ගය වශයෙන් සලකා උන් වහන්සේ වේළුවනාරාමයෙන් පිටව පාරිලෙය්‍ය වනයට වැඩමකළ වග පුංචි දවස්වල දහම් පාසලේදී අප ඉගෙන ගන්නා ලද, කවදත් අමතක නොවන කථා පුවතෙකි.**





මෙම ශුද්ධ භූමියේ චමත්කාරය විඳදරාගැනීමට නම් ඔබ පසළොස්වක පුරසඳ පෑයු කිරිවන් සඳ එළියෙන් මුළු පරිසරයම වසාගත් සොඳුරු රැයක සඳරාජ වනයේ මදක් රැඳී සිටිය යුතුය. "සඳරාජ වන අරණ" නමින් හැඳින්වෙන මෙම සුන්දර වනපෙත පිහිටා ඇත්තේ සිංහරාජ වැසි වනාන්තරය සිරිපා අඩවිය, කුරුලු කැලේ සල්ගල බඳු සෞන්දර්යයෙන් අගතැන්පත් සොබා දම් දිනිතියගේ මනරම් නිමවුම් රැසක් දයාද කරගත් සබරගමුව පළාත තුළය.

**යූ.පී.එස්.පතරණ**

පාරිලෙය්‍ය වැනි විසල් වන පියසක විවේකී සුව විඳීමට බුදුරජාණන් වහන්සේ තෝරා ගත්තේ තුරු ලතාවන්ගෙන් සපිරුණු වනාන්තරය සමාධි සුව විඳිනට හොඳම තැන ලෙස උන් වහන්සේ අතැඹුලක්සේ දත් නිසා විය හැකිය. බුදුරජාණන් වහන්සේට ඇප උපස්ථාන කිරීමට පැමිණි වඳුරා හා ඇතා තුළින් දෘෂ්‍යමාන වන වැදගත්ම දෙය වනුයේ, පරිසරයට ආදරය කරන්නේ නම් එහි ගහකොළ පමණක් නොව එම පරිසරයට අයත් සතා සිව්පාවාගේ ආදරයද ලැබෙන බවයි. දෝතළු ඔය සඳරාජ වන අරණ මගේ මතසට නංවන්නේද පාරිලෙය්‍ය වනය බඳු සෞන්දර්යය හා බැඳුණු ශුද්ධ භූමියකි. මෙම ශුද්ධ භූමියේ චමත්කාරය විඳදරාගැනීමට නම් ඔබ පසළොස්වක පුරසඳ පැයු කිරිවන් සඳ එළියෙන් මුළු පරිසරයම වසාගත් සොඳුරු රැයක සඳරාජ වනයේ මදක් රැඳී සිටිය යුතුය. "සඳරාජ වන අරණ" නමින් හැඳින්වෙන මෙම සුන්දර වනපෙත පිහිටා ඇත්තේ සිංහරාජ වැසි වනාන්තරය සිරිපා අඩවිය, කුරුලු කැලේ සල්ගල බඳු සෞන්දර්යයෙන් අගතැන්පත් සොබා දම් දිනිතියගේ මනරම් නිමවුම් රැසක් දයාද කරගත් සබරගමුව පළාත තුළය. සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගන්තුන, මැදගම ග්‍රාමසේවා වසමට අයත්, දෝතළු ඔය ලේපලාව වත්තේ මෙම සඳරාජ වනය පිහිටා තිබේ.

මෙම සඳරාජ වන අරණට ළඟාවිය හැකි මාර්ග දෙකක් වේ. කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයේ මාවනැල්ල නගරයට නුදුරින් දකුණට දිවෙන අරණායක පාරේ අරණායක අම්බලකන්ද හරහා දෝතළුඔය වනයාය ඔස්සේ ද දෝතළු ඔය වතුයාය ඔස්සේ ද මෙහි ළඟාවිය හැකිය. මෙහි ළඟාවීමේ දී මාර්ග පද්ධතියේ දුෂ්කරතාවලට මුහුණපෑමට සිදු වුවද, සඳරාජ වන අරණට පිවිසීමට ඔබට අවස්ථාවක් ලැබීම ඇත්තෙන්ම ඔබගේ පෙර කුසලක් ලෙස දැනෙනු නිසැකය.


සොබා දහමේ අපූර්ව නිර්මාණයක් වන මෙම වැසි වනයේ නැගෙනහිර මායිම් නුවරඑළිය දිස්ත්‍රික්කය වීම මෙහි දේශගුණික තත්ත්වයත් පිළිබඳව ඉඟියක් ලබාදේ. මෙහි සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 26 ක් පමණ වන අතර වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය මි.මී.4400 ක් පමණ වේ.




අක්කර 120 ක පමණ භූමි ප්‍රමාණයක් වසා පැතිර ඇති මෙම වන පියස කුඩා ඔයට හා ගුරුගොඩ ඔයට මායිම්ව පිහිටා තිබේ. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේදී තේ වගාවෙන් වසාගත් කඳුකර පරිසරයක තමුදු, මෙහි උස්බිම් ප්‍රාථමික වනාන්තර ලක්ෂණ පෙන්නුම් කරයි.

සඳරාජ වනය තුළින් අහසට නැගුනු ගල්පලාව කඳු ගැටය මුදුණට ගියවිට අවට දැකිය හැකි දසුන් ඉතාම චමත්කාර ජනක වේ. එම සුන්දර දසුන් අතරට රක්වාන පූඑතොට හෙල් වැටියත්, දුම්බර කඳුයායත්, පේරාදෙණිය, හන්තාන, පිම්රෝස් කඳුවැටි හරහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ හරි අඩකුත් නිතැතින්ම හසුකර ගත හැකිය. එපමණක් නොව, මිහිදුමෙන් තොරවූ පරිසරය වඩාත් පැහැදිලි දිනකදී කළුතර පාලම, කොළඹ නගරය, මීපේ චන්ද්‍රිකා මධ්‍යස්ථානය, කටුනායක ගුවන්තොටුපළ ද දැක බලා ගැනීමටද හැකිය. රාත්‍රී කාලයේ දී නම් විදුලි පහනින් දල්වුනු එම ඈත මංපෙත් මනස්කාන්ත දසුනකි. මෙහි සිට සඳරාජ වනයට නුදුරින් පිහිටි සුප්‍රකට බතලේගල, වාකිරිගල, දෙවනගල උතුවන්කන්ද නෙතට හසුකරගත හැකි සතර කෝරලයේ සුන්දර දසුන් වේ.

කන්නෙලිය, දෙදියගල, නාකියාදෙණිය වැනි නිරිතදිග වැසි වනාන්තර හා සමකළ හැකි වැදගත්කමක් ඇති මෙම වැසි වනාන්තරය ජෛව විවිධත්වය අතින්ද ඉතා ඉහළ මට්ටමක පවතී. දුර්ලභ ගණයේ ශාක හා ජීවීන් විශේෂ රැසකටද නිජබිම වී ඇති මෙම වනයේ ශාක ප්‍රජාව ඒක දේශීය මෙන්ම එම ප්‍රදේශයට ආවේණික ශාක හා දුර්ලභ ගණයේ





ශාක විශේෂ කිහිපයක්ද ඇතුළත් වේ. ඒ අතර, හොර, මීල්ල, වැලිපියන්න, දවුල්කුරුඳු කටු කුඩුරු, දියපර, ගොඩපර, මලබඩ, හැඩවක, කැකුණ, කළුකම්බේරිය, බැදිදෙල්, ඇටඹ, ගල්වෙරළු, මොර, කටුබොඩ, කීන, දෙඹ, වන මී, කැටකැල ආදියද ඇතුළත් වේ. මීට අමතරව සඳරාජ වනයටම ආවේණික නවරැල්ල මෙන්ම මහ හැඩයා, කුඩා හැඩයා කඳුලස්ස ශාක සමග සඳරාජ, ඉර රාජ, ගරුඩරාජ, වැනි දුර්ලභ ගණයේ ඖෂධ පැළෑටි ද වේ.

සඳරාජ වනය තුළ වල් ඌරා, වැලිමුවා, හාවා, හිවලා, කැලෑබළලා, ඇයා, පොතු ඇයා, හෝතඹුවා, ඉත්තෑවා, කබල්ලෑවා, වඳුරා, රිළවා, දඬුලේනා, උලලේනා, හම්බාවා, කබරයා, තලගොයා, හිකනලා, සහ කටුසු විශේෂ කීපයක්ද නිතරම හමුවේ. මීට අමතරව සියොතුන් නිරීක්ෂණය කිරීමටද සඳරාජ වනය කදිම පරිසරයකි. ශ්‍රී ලංකාවේ හමුවන පක්ෂි විශේෂ විශාල සංඛ්‍යාවක් මෙහිදී නිරීක්ෂණය කළ හැකි අතර, ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂි විශාල සංඛ්‍යාවක්ද ඒ අතර වේ. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වන වලි කුකුළා, හබන් කුකුළා, පොරෝ දැකැත්තා, රතු මුහුණැති මල් කොහා, මල් සූටික්කා, සුදුරෙදි හොරා, සැළලිහිණියා මෙන්ම ගිරවුන් හා කවුඩු විශේෂ රැසක්ද මෙම වනය වඩාත් ආකර්ෂණීය ස්ථානයක් බවට පත්කර තිබේ.

පැරැන්නන්ගේ වචනයෙන් පවසතොත් සඳරාජ වන අරණ පිහිටා ඇත්තේ සතර කෝරළයේ දැඩිමුණ්ඩ දෙවියන්ගේ හාස්කම් පවත්නා මහදෙවි අඩවිය තුළය. එක් අතකින් මෙම වනයද එම මහදෙවි අඩවියේ පිහිටි හාස්කමකි.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධානයක් වන, මිහිසර සංවිධානය විසින් දැනට එක්සත් ජාතීන්ගේ පරිසර සහ සුළු මූල්‍යධාර වැඩ යටතේ ප්‍රදානයන්ද ලබා ගනිමින් අංග සම්පූර්ණ ජෛව විවිධත්ව මධ්‍යස්ථානයක් වශයෙන් පවත්වාගෙන යාමට සැලසුම්කර ඇති මෙම සඳරාජ වන අරණ අද විදෙස් සංචාරකයන් කැඳවන කදිම තෝතැන්නෙකි. එසේම මෙම වනයේ හා එහි අවට පරිසරය තුළ ජෛවීය හා අජීවී සම්පත් පිළිබඳව අධ්‍යයනය කිරීමට පැමිණෙන පාසල් දරු දැරියන්ගේ සංඛ්‍යාවද දිනෙන් දින ඉහළ යමින් පවතී.

කෙසේ හෝ වේවා, ආත්මාර්ථකාමී බවින් පරිසරය විනාශකර දිවි ගැට ගසා ගැනීමට වලිකන අකාරුණික මිනිසුන් ගහණ මෙවන් සමයක සඳරාජ වන අරණ වැනි අගනා සම්පතක් අනාගත පරපුරට ඉතිරි වී තිබීම ඇත්තෙන්ම සතර කෝරළයේ මහදෙවි අඩවියේ වෙසෙන ජනතාවගේ පමණක් නොව, මුළුමහත් ශ්‍රී ලාංකික ජනතාවගේම වාසනාවක්බව මෙහිදී සඳහන් නොකරම බැරිය. ❑